# ඇමෙරිකාවේ ගැමි තරුණ තරුණියන් නිසි මග යවන තරුණ ගොවි සමාජ



ඇමරිකා එක්සත් ජනපදයේ තරුණ ගොවි සමාජ තරඟයක්

**මගේ හිස පැහැදිලි චින්තනයටත්,**
**මගේ හද ගැඹුරු පක්ෂපාති භාවයටත්,**
**මගේ දෑත් පුළුල් සේවයකටත්,**
**මගේ සෞඛ්‍යය නිරෝගී ජීවිතයකටත්,**
**යොදු මගේ සමාජය, මා ජීවත් වන ප්‍රජාව**
**සහ මගේ රට වෙනුවෙන් කැප වෙන**
**බවට මා දිවුරා පොරොන්දු වෙනවා.**

ඇමරිකා එක්සත් ජනපදයේ තරුණ ගොවි සමාජ සංකේතවත් කරන 4–එච් යන්න සකස් කර ගෙන ඇත්තේ සමාජයේ සාමාජිකයින් දිවුරුම් දිය යුතු ඉහත සඳහන් ගිවිසුමේ සඳහන් වන හිස, හද, දෑත් හා සෞඛ්‍යය යන වචන-වලට යොදන ඉංග්‍රිසි වචනවල මුල් අකුරු ගෙන යි.

මේ 4–එච් සමාජ එරට ග්‍රාමීය පෙදෙස්වල යොවුන් වියේ තරුණ තරුණියන් ගේ පෞරුෂත්වය, චරිතය, කාර්යක්ෂමතාවය ශක්තිමත් කර ලීමට ඉටු කරන සේවාව ගැන ලොව පතලයි. එරට කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ කොටසක් ඉටු කරනු ලබන්නේත් මේ 4–එච් සමාජ මගිනුයි. ආගමික නාය-කයන්, ගුරුවරු, වෙනත් වෘත්තීන්හි නියුක්ත වූවෝ සහ දක්ෂ ගොවීන් මෙම ව්‍යාපාරවල ප්‍රාදේශීය නායකයින් හැටියට තම තමන්ගේ සේවය ලබා දෙන අතර, එහි වැඩ කටයුතු වලට අවුරුද්දකට යොවුන් වියෙහි වුවන් විසි ලක්ෂයකට අධික දෙනා සහභාගි වෙනවා.

සමාජයේ හැම සාමාජිකයකු ම ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරී තැන ගේ පරීක්ෂාව යටතේ, එක්කෝ වඩා හොඳ කෘෂිකර්ම ක්‍රමයක්, නැතිනම් ගෘහ පාලනය පිළිබඳ නව දැනුමක් ලබා දෙන හෝ ඉගැන්වීමක් සිදු කෙරෙන කාර්යයක නිරත විය යුතු යි. යෞවන යෞවනියන්ට ඔවුන් ගේ කෙත්වල, ගොවිපලේ, ගෙවත්තේ හෝ ගෙවල්වල මතු වන විවිධආකාරයේ ප්‍රශ්නවලට මුහුණ පාන්න ඉඩ සලස්වන අතර, ඒ ප්‍රශ්න වඩා හොඳ ක්‍රම අනුව විසඳන අන්දම පිළිබඳ දැනුම ප්‍රායෝගිකව ලබා දේ. එක් එක් සාමාජිකයකු වියදම, වැඩෙහි යෙදෙන පිළිවෙළ හා ප්‍රතිඵල පිළිබඳ වාර්තා පවත්වා ගනී. ඊට අමතරව එම වැඩ කටයුතු ගැන සෙසු අයට ද කියා දීමෙහි යෙදෙන ඔහු තමා ගේ සාර්ථක වූ ප්‍රතිඵලද හැමවෙත හුවා දක්වයි. වසර අවසානයේ දී ඔහු ගේ කටයුතුවල කාර්යක්ෂමතාවය පිළිබඳ කෙටි විග්‍රහයක් කරමින් සාර්ථකවීම් හා අසාර්ථකවීම් වලට හේතු විමසී මෙහිද යෙදේ.

**4–එච් සමාජවල ප්‍රධාන අරමුණු වන්නේ:**

1. ග්‍රාමීය තරුණයන් උසස් අරමුණු කරා යොමු කරවීමටත්, ගොවිතැන් කටයුතු

වලට, ගෘහ පාලනයට, ප්‍රජා කටයුතුවලට සහභාගි වීම ඉහළ මට්ටමකට ගෙන ඒමටත්, ඒවාගේ ම ඔවුන් ලබා ගන්නා ඒ දියුණුව පිළිබඳ වගකීමක් ඔවුන් තුළ බිහි කරවීමටත්,

2. ගොවිතැන් කටයුතුවල සහ ගෘහ පාලනයට උවමනා තාක්ෂණික දැනුම හා මහ පෙන්වීම ඔවුන්ට ලබා දීමටත්,

3. ග්‍රාමීය යෞවන යෞවනියන් ගොවිපලවල හා ගෙවල යම් යම් ව්‍යාපාරවල කෙරෙන කටයුතු 'එහි යෙදී ඉගෙනුමට' අවස්ථාවක් දීමටත්, ඔවුන් උගත් දෑ වල දස්කම් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දීමටත්,

4. පර්යේෂණයක් කරන ස්වභාවය පිළිබඳ වැටහීමක් ඒ අයට ලබා දීමටත් සහ ඔවුන්නොවුන් ගේ ප්‍රශ්න විසඳීමට විද්‍යාත්මක ආකල්පයකින් එළඹීමටත්,

5. ඔවුන් සමූහයක් හැටියට අන්‍යොන්‍යව උපකාරීව කටයුතු කිරීමටත්, ඒ අනුව ඔවුන් ගේ සම්බන්ධතාවයන් වැඩි කර ගැනුමට ඉඩ සැලැස්වීමත්,

6. සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට හැඩ ගස්වන පිළිවෙත්වලට ඇබ්බැහි කිරීම, විවේක කාලය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීම, වටිනා අනාගත බලාපොරොත්තු ඇති කරවීම සහ සම්පූර්ණවූත් වාසනාවන්ත වූත් ජීවිතයකට යොමු වන පරිදි !අධ්‍යාපනය දිගටම කර ගෙන යාමට උනන්දුවක් ඔවුන් තුළ ජනිත කරවීමටත්,

7. ගොවිතැන් කටයුතු මගින් ඔවුන් ආදායම් වැඩි දියුණු කර ගන්නා අන්දමත් සහ ඒ මගින් ඔවුන් ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරන සැලැස්මක් පෙන්වා දීමටත් ය.

**ගතෙනුත්, සිතෙනුත් සහ අධ්‍යාත්මික හැඟුමෙනුත් අනාගත රටවැසියන් හැඩ ගැස්වීමට 4-එච් සමාජයන් අරමුණුකර තිබේ.**

1. වඩා ප්‍රයෝජනයක් ඇති වන අන්දමට කුසලතා වර්ධනය කිරීමට රුකුල් දීම.
2. මිතුරන් සමඟ වැඩ වලට, විනෝදාංශවලට සහභාගි වීම.
3. වෙනස් වන ලෝකයට හැඩ ගැසීමට ඉගැන්වීම.
4. ජීවන මාර්ගයක් වශයෙන් රැකියාවක් තෝරා ගැනීමට උදව් වීම.
5. කෑමට සහ විකිණීමට ආහාර හා කෙඳි වර්ග නිපදවීම.
6. හොඳ ජීවිතයකට උචිත හොඳ වාතාවරණයක් ගෙවල ඇති කිරීම.




**''මේ බලන්න. මා හදපු බැටළුවට පළමුවෙනි තෑග්ග හම්බවුනා'' ඇය 4-එච් සමාජයක ප්‍රබල සාමාජිකාවක්.**

7. ස්වාභාවික සම්පත්වල සුරක්ෂිත භාවයත් ඇති කර හැම ගේ සතුටට ප්‍රයෝජනවත් වන පරිදි රැක ගැනීම.
8. මනා සෞඛ්‍යයෙන් යුතු ශක්ති සම්පන්න රටක් ගොඩ නැගීම.
9. ප්‍රජා කටයුතුවල වැඩි දියුණුවක් ඇති කිරීමට තිබෙන වගකීම් බෙදා ගැනීම.
10. ලෝක සාමය උදෙසා කටයුතු කරන රටවැසියන් පිරිසක් බිහි කරලීමත් ය.

සාමාන්‍යයෙන් 'අවුරුදු 10–20 අතර වයස් වල අයට 4–එච් සමාජවල සාමාජිකයින් විය හැකි යි. සාමාජිකත්වය ලැබීමට සුදුසු පිළිවෙළ කලින් ද සඳහන් කළ පරිදි එක් එක් ගැහැණු හෝ පිරිමි ළමයකු කෘෂි කර්මය හෝ ගෘහ පාලනය පිළිබඳ වැඩි දියුණු මාර්ග උගැන්වෙන කටයුත්තක යෙදීම කළයුතුම ය.

4–එච් සමාජවල ආදර්ශ පාඨයෙන් ඉදිරි පත් කරන පණිවුඩය ඍජු චරිතයත් හා ප්‍රයෝජනවත් රටවැසියකු හැටියට ඔවුන් ව වර්ධනය කිරීමත් මෙන්ම මෙම ව්‍යාපාරය දියුණු වෙන් දියුණුවට ගෙන යාම ද වේ.

ඇමරිකා එක්සත් ජනපදයේ විවිධ පළාත් වල පිහිටා ඇති 4–එච් සමාජ ඔවුන් ගේ අරමුණු කියා පාන ආදර්ශ පාඨ සකසා තිබෙනවා. ඒවායින් වඩාත් පතල වී ඇති කිහිප යක් පහත දක්වා ඇත.



**අයිය මලෝ උදේ රැයින් නැගිට ගොන් වස්සා ප්‍රදර්ශණයට සූදනම් කරයි.**

'පළමුව ඔබ ඔබට ම ආදර්ශයක් වන්න'

'වැඩෙහි යෙදී ඒ ගැන ඉගෙන ගනිමු.'

'මා මගේ හොඳම වාර්තාව බිඳ හෙලිය යුතු යි'.

**ඍජු චරිතයක් හා ප්‍රයෝජනවත් රටවැසියකු තැනීම අරමුණු කොටගත් 4 – එච් සමාජ එරටට මහගු සේවයක් ඉටු කරන අතර, මුළු මහත් ලෝකයට ආදර්ශයක්ද වන්නේය.**

'පුරසාරමෙන් තොරව දිණුමත්, ක්‍රෝධ යෙන් තොරව පරාජයත් පිළිගනිමු.'

'අපේ වැඩ පළමුව සැලසුම් කරමු, අන-තුරුව ඒ සැලසුමට අනුව ක්‍රියා කරමු.'

හැම 4–එච් සමාජ සාමාජිකාවකමට අවල අවංකකමෙහි වැදගත්කම උගැන්වෙන අතර, තම කටයුතු වලදී බැංකු හා ගනුදෙනු කිරීමේ ඒ බැංකුවලට ඔවුන් ගෙන් ඇති වගකීම් ඉටු නොකරන සාමාජිකයකු හිටියොත් ඒ ඉතාම කලාතුරකිනි.

ඉතින්, 4–එච් සමාජ නිවසට ගොවිපලට සහ ගමේ ප්‍රජාවට කාර්යක්ෂම සේවයක් ගෙන දීමට ස්ථිර වශයෙන් ම මෙහෙයක් ඉටු කළා. තරුණ තරුණියන් අත්දැකීම් අතින් පොහොසත් පිරිසක් බවට පත් වුනා. ඔවුන් ට ලා බාල අය අතර සෞඛ්‍ය සම්පන්න භාවය ගැන සැලකිලිමත් වීමේ වැදගත්කම [ගැන හැඟීමක් ජනිත කරවීමට හැකිවුනා ගමේ යෞවනයින්ට ආර්ථික අතින් ස්වාධීනත්වයක් ගෙන දීමටත්, අධ්‍යාපනික අවස්ථාවන්, නිවැරදි කෘෂිකාර්මික තොරතුරු දීම සහ ඒ ඒ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන දක්ෂයින් අඳුනා ගැනීමටත් අවස්ථාවක් ඔවුන්ට ලැබුණා. මේ 4–එච් සමාජවල දී ලබා දෙන්නා වූ ප්‍රයෝජනවත් කටයුතුවලින් කිහිපයක් පමණ යි.

**(සැකසීම; සරත් දයානන්ද සහ කේ. තිලයනාදන්)**